සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පංතියට බඳවා ගැනීමේ

# විවෘත තරග විභාගය - 2009 (2010)

## (01) භාෂා හැකියාව

## II කොටස

මිනිත්තු තිහයි

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

1. විදේශයක සිටින ඔබේ පැනේ මිතුරකු / මිතුරියක කෙටි නිවාඩුවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමේ අපේක්ෂාවෙන් සිටින බව දන්වා ඔබට ලිපියක් ලැබේ. එමගින් ශ්‍රී ලංකාවේ දී නැරඹීමට සුදුසු වැදගත් ඓතිහාසික ස්ථාන ගැන තොරතුරු ඔබෙන් ඉල්ලා ඇත. මෙබඳු ඓතිහාසික ස්ථාන දෙකක් ගැන තොරතුරු ඇතුළත් කොට පැනේ මිතුරාට / මිතුරියට යැවීම සඳහා ලිපියක් පිළියෙල කරන්න. ඔබ තෝරාගත් ඓතිහාසික ස්ථාන දෙක, එහි වැදගත්කම, පිහිටීම, නවාතැන් හා ගමන් පහසුකම්, කොළඹ සිට ඇති දුර ප්‍රමාණය හා අදාළ වෙනත් තොරතුරු ලිපියේ ඇතුළත් විය යුතුය. (වචන 100 ට නොඅඩු 150 ට නො වැඩි විය යුතු ය.)

**(ලකුණු 25 යි)**

2. මෙහි දැක්වෙන එක් එක් පාඨයේ ඇතුළත් කෙටි වාක්‍ය අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ දෝෂවලින් තොරව යෝග්‍ය පරිදි ගලපා තනි වාක්‍යය බැගින් ලියන්න.

    (i) වර්තමානයේ ගෝලීය මූල්‍ය අර්බුදයක් පවතී. එමගින් දේශීය මූල්‍ය වෙළෙඳපොළ මත අහිතකර බලපෑම් ඇති වේ. මේ බලපෑම් අවම කළ යුතුය. මේ සඳහා මහ බැංකුව විසින් පියවර කීපයක්ම ගන්නා ලදී.

    (ii) මහ බැංකුව සතුව සන්නිවේදන ක්‍රමෝපායයන් පවතී. මේවා මහජනතාවට උපකාරී වේ. මෙමගින් මහජනතාවගේ උද්ධමන අපේක්ෂාවන් සීමා කෙරේ. වෙළෙඳපොළ අපේක්ෂාවන් සහ මහ බැංකුවේ පුරෝකථනයන් අතර පරතරය අඩු කෙරේ.

    (iii) උතුරු පළාතේ ස්වභාවික සම්පත් ඉතා පුළුල් පරාසයක විහිදී ඇත. මේවායින් නිසි ප්‍රයෝජන ගත යුතු වේ. ඒ අනුව කන්කසන්තුරෙයි කර්මාන්ත ශාලාව යළි ස්ථාපනය කළ යුතුය. එසේම පරන්තන් රසායනික කර්මාන්ත ශාලාව ද ස්ථාපනය කළ යුතු වේ. මේවා යාපනයේ ඇති ප්‍රධාන කර්මාන්ත ශාලාය.

    (iv) ඉහළ මූල්‍යයන පිරිවැය සහ භාණ්ඩ සඳහා පවත්නා ඉල්ලුම අඩු වී ඇත. එහෙයින් විශේෂයෙන් ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මෙහෙයුම් ශක්‍යතාව පවත්වා ගෙන යාම අසීරු වී ඇත. මේ නිසා ඒවායේ පැවැත්ම සඳහා කිසියම් රාජ්‍ය මූල්‍ය සහනයක් සපයා දිය යුතු වේ.

    (v) අපනයන කෘෂිකාර්මික අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් තේ නිෂ්පාදනය දායක විය. පොල් නිෂ්පාදනය ද දායක විය. රබර් නිෂ්පාදනය ද එම අංශයේ වර්ධනයට හිතකර ලෙස දායක විය.

**(ලකුණු 75 යි)**

* * *